පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# තෙවන වාර පරීක්ෂණය - 2023
# පෙරදිග සංගීතය I, II

පාසලේ නම : ..............................................

ඇතුළත්වීමේ අංකය : ..........................

කාලය : පැය 03 යි

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. භෛරවී රාගයට අදාළ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) වාදී පංචමය වන අතර, සංවාදී මධ්‍යමය වේ.
(2) ගාන සමය රාත්‍රී ප්‍රථම ප්‍රහරය වේ.
(3) විවාදී ස්වරයක් ලෙස කෝමල රිෂභය භාවිත වේ.
(4) සම්පූර්ණ ජාතියට අයත් වේ.

02. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගාන සමය යෙදෙන නිර්දේශිත සම්පූර්ණ ජාති රාගය කුමක් ද?
(1) යමන් (2) බිලාවල් (3) භූපාලි (4) කාෆි

03. නි̣ රි ස, නි̣ රි ග රි ස, යන ස්වර අභ්‍යාසය යමන් රාගයට අනුව ලියූ විට ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
(1) නි̣ රි ග ම́ ස රි ස (2) නි̣ රි ග ම́ ග රි ස
(3) නි̣ රි ග ම ග රි ස (4) නි̣ රි ග රි ස රි ස

04. භූපාලි රාගයේ වර්ජිත ස්වර ඇතුළත් වරණය තෝරන්න.
(1) ග, නි (2) ප, නි (3) ම, නි (4) ප, ස

05. විවාදී ස්වර සම්බන්ධයෙන් **සත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මෙම ස්වර රාගයක කිසිවිටකත් භාවිත නොවේ.
(2) විවාදී ස්වර හේතුවෙන් රාගයේ ජාතිය තීරණය වේ.
(3) සෑම රාගයකම විවාදී ස්වර භාවිත වේ.
(4) විවාදී ස්වර භාවිත කිරීමෙන් රාගයේ රස වැඩිකර ගත හැකි වේ.

06. රාග උත්පාදනය කිරීමේ ශක්තියක් සහිත ස්වර සැකසුම,
(1) මධ්‍යලය ගීත යනුවෙන් හැඳින්වේ. (2) ථාට යනුවෙන් හැඳින්වේ.
(3) සර්ගම් යනුවෙන් හැඳින්වේ. (4) මුඛ්‍යාංග යනුවෙන් හැඳින්වේ.

07. වාදී ස්වරය හා සංවාදී ස්වර හැර, රාගයේ ඉතිරි ස්වර,
(1) විවාදී ස්වර වේ. (2) වර්ජිත ස්වර වේ.
(3) අනුවාදී ස්වර වේ. (4) මුඛ්‍යාංග ස්වර වේ.

08. I ග රි ස I ධ̣ ස රි ග I ප ග ධ I ප ග රි ස I මෙම ස්වර පාදය පිළිබඳ **නිවැරදි** කියමන තෝරන්න.
(1) බිලාවල් රාගයට අයත් මුඛ්‍යාංගය ජප්තාලයට අනුව ප්‍රස්තාර කර ඇත.
(2) භූපාලි රාගයට අයත් මුඛ්‍යාංගය ජප්තාලයට අනුව ප්‍රස්තාර කර ඇත.
(3) භූපාලි රාගයට අයත් මුඛ්‍යාංගය දීප්චන්දි තාලයට අනුව ප්‍රස්තාර කර ඇත.
(4) බිලාවල් රාගයට අයත් මුඛ්‍යාංගය දීප්චන්දි තාලයට අනුව ප්‍රස්තාර කර ඇත.

09. ව්‍යවහාරික සංගීතයේ දී තාලයේ වේගය හඳුන්වන නම කුමක් ද,?
(1) Beat (2) Intro (3) Tempo (4) Tone

- **ප්‍රශ්න අංක 10 සිට 14 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ගී පාද උපයෝගි කරගන්න.**

| | | | |
|---|---|---|---|
| A | • ආදරයේ උල්පත වූ අම්මා | B | • රුක් අත්තන මල මුදුනේ |
| C | • කවුරුදෝ අර කවුළුවෙන් | D | • අඳුර අඳුර මගේ |

10. ඉහත ගී පාද ඇතුළත් ගීත පොදුවේ හඳුන්වන්නේ,
    (1) සරල ශාස්ත්‍රීය ගීත ලෙස ය.
    (2) සරල ගීත ලෙස ය.
    (3) ජන නාද මාලා ආශ්‍රිතව නිර්මාණය වූ ගීත ලෙස ය.
    (4) රාගාශ්‍රිතව නිර්මාණය වූ ගීත ලෙස ය.

11. සේ ගී නාද මාලා ආශ්‍රය කොටගෙන නිර්මාණය වී ඇති ගීත පාදයට හිමි ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
    (1) A (2) B (3) C (4) D

12. භෛරවී රාගය ආශ්‍රයෙන් තනු නිර්මාණය වී ඇති ගී පාදයට හිමි ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.
    (1) A (2) B (3) C (4) D

13. කෙහෙර්වා තාලයට අනුව නිර්මාණය වී ඇති ගී පාදයට දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
    (1) A (2) B (3) C (4) D

14. A අක්ෂරයෙන් දැක්වෙන ගීතයේ තනුව නිර්මාණය කර ඇති ජන නාද මාලාව කුමක් ද?
    (1) ගොයම් ගී නාද මාලාව (2) නෙළුම් ගී නාද මාලාව
    (3) දරු නැළවිලි ගී නාද මාලාව (4) කමත් ගී නාද මාලාව

15. ශිල්පියෙකු සජීවීව ගැයූ ගීතයක් ඒ අයුරින්ම උපකරණයක් ආධාරයෙන් නැවත ශ්‍රවණයට අවකාශ සැලසූ මුල්ම උපකරණය කුමක් ද?
    (1) ගුවන්විදුලිය. (2) රූපවාහිනිය.
    (3) ග්‍රැමෆෝනය. (4) කැසට් රෙකෝඩරය.

16. ශ්‍රී ලංකාවේ ජන සංගීතය මූලිකව බෙදා ඇති කොටස් දෙක කුමක් ද?
    (1) ජන ගී - සේ ගී (2) ගැමි ගී - සේ ගී
    (3) සේ ගී - මෙහෙ ගී (4) ගැමි ගී - මෙහෙ ගී

17. ආඛ්‍යානාත්මක **මෙහෙ** ගී විශේෂයකි,
    (1) මේවර ගී (2) ඔළිඳ ගී
    (3) තුන්සරණේ ගී (4) කමත් ගී

18. **"ඒ බුදු බව පතමින් ලොබිනේ"** යන නාඩගම් ගීතය ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති නව නාට්‍ය ගීතය කුමක් ද?
    (1) දුලා නෙතුපුලා (2) මෑ වේ මා දුටු කොමළ ලියා
    (3) ප්‍රේමයෙන් මන රංජිත වේ (4) සේ සුරිඳු

19. තබ්ලාවෙන් උපදින **ශුද්ධ** අක්ෂර පමණක් අඩංගු වරණය තෝරන්න.
    (1) න, ධිං, නං, තා (2) ධා, ගෙ, ක, කත්
    (3) ගෙ, න, තිං, තා (4) ධිං, තිරිකිට, න, තා

20. **"හෙළ ගී මග"** නම් ග්‍රන්ථයේ කතුවරයා කවුරුන් ද?
    (1) රෝහණ බැද්දගේ (2) ඩබ්ලිව්.බී. මකුලොලුව
    (3) ලයනල් රන්වල (4) සී. ද එස් කුලතිලක

21. ව්‍යවහාරික සංගීත ස්වර ලිපියක "Inter" යනුවෙන් කෙටියෙන් දක්වා ඇත්තේ කුමක් ද?
    (1) හඳුන්වා දීමේ වාදනය (2) පෙර වාදනය
    (3) අතුරු වාදනය (4) මුල් ගායනය

22. ස්ථායි සහ අන්තරා වශයෙන් ගීත ආකෘතිය දක්නට ලැබෙන ශාස්ත්‍රීය ගායන ශෛලිය කුමක් ද?
    (1) ඛ්‍යාල් (2) තුම්රි (3) ගසල් (4) භජන්

23. **"බෙයිජු බව්රා"** චිත්‍රපටයේ අඩංගු ගීතයක් වන්නේ,

(1) තෙරේ මේරේ මිලන් කී (2) ජනක ජනක පායල භාජේ

(3) තූ ගංගා කී මෞජු මෙ (4) අබතුහේ තුම සේ

24. විෂම ග්‍රහයෙන් ගැයෙන ගී පාදය කුමක් ද?

(1) සසර වසන තුරු (2) දුර පෙනෙන තැනිතලා

(3) අම්මා සඳකි (4) මිහිමඬලේ අඳුරු කුසේ

25. ඇතැම් නූර්ති ගීතයන් හි තාලයෙන් තොරව ගැයෙන විශේෂ කොටස් හඳුන්වන නම කුමක් ද?

(1) උරුට්ටුව (2) දොහොරාව

(3) අඩව්ව (4) මුද්‍රප්පදය

- **ප්‍රශ්න අංක 26 සිට 29 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන් උපයෝගී කරගන්න.**



**A** **B** **C** **D**

26. බ්‍රාස් වින්ඩ් (Brass Wind) වර්ගයට අයත් භාණ්ඩය ඇතුළත් අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

27. ඩබල් රීඩ් (Double Reed) භාණ්ඩය ඇතුළත් අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) D

28. රීඩ් ලස් (Reed Less) වර්ගයට අයත් භාණ්ඩය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

29. සින්ගල් රීඩ් (Single Reed) වර්ගයට අයත් භාණ්ඩය දැක්වෙන අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) D

30. B Flat Major ස්කේලයේ යෙදෙන විකෘති ස්වර දෙක කුමක් ද?

(1) B Flat , A Flat (2) B Flat , E Flat

(3) A Flat , G Flat (4) A Flat , D Flat


31.



මෙම රූපයේ දැක්වෙන සංකේතය කුමක් ද?

(1) Dotted Minim (2) Dotted Minim Rest

(3) Minim Note (4) Dotted Crotchet

32.  මෙම රූපයේ දැක්වෙන සංකේතයේ නම කුමක් ද?

(1) Quaver Note (2) Quaver Rest
(3) Semi Quaver Rest (4) Crotchet Rest

33. හරිප්‍රසාද් චෞරසියා සහ ශකීර් හුසේන් ඛාන් යන සංගීතඥයින් දෙදෙනා ප්‍රසිද්ධ වී ඇත්තේ පිළිවෙළින්,
(1) තබ්ලා වාදනයට හා බටනලා වාදනයට.
(2) බටනලා වාදනයට හා තබ්ලා වාදනයට.
(3) සිතාර් වාදනයට හා තබ්ලා වාදනයට.
(4) එස්රාජ් වාදනයට හා බටනලා වාදනයට.

34. ගසල් ගීත ගායනය සඳහා ප්‍රසිද්ධ භාරතීය ගායන ශිල්පියෙකු ගේ නම සඳහන් වරණය තෝරන්න.
(1) ජග්ජිත් සිං (2) රවිශංකර්
(3) ඒ.ආර්. රහුමාන් (4) අල්ලා රක්කා ඛාන්

35. විද්‍යා විෂයට අනුව මධ්‍ය සඩ්ජයේ හා උච්ච සඩ්ජයේ කම්පන සංඛ්‍යාතයන් පිළිවෙළින් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
(1) 258Hz – 516Hz (2) 256Hz – 512Hz
(3) 254Hz – 508Hz (4) 512Hz – 256Hz

36. පිළිවෙළින් C Minor හා F Minor කෝඩ් සඳහා යෙදෙන ස්වර නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) F A C / C E G (2) F $A^b$ C / C $E^b$ G
(3) C $E^b$ G / F $A^b$ C (4) C $E^b$ G / F A C

37. මීන්ඩ්, ගමක්, මූර්කි ආදී හින්දුස්තානි ශාස්ත්‍රීය සංගීතාංග භාවිත කරමින් නිර්මාණය වී ඇති ගීත විශේෂය කුමක් ද?
(1) නාඩගම් ගී (2) නූර්ති ගී
(3) කෝලම් ගී (4) කණ්ඩායම් ගී

38. පසන්, තිර්ලානා, තංගපාට වැනි තාල වාදනය කිරීමට යොදා ගන්නා සංගීත භාණ්ඩය කුමක් ද?
(1) දවුල (2) තබ්ලාව (3) මද්දලය (4) මෘදංගය

39. අළුවක් (Bow) ආධාරයෙන් වාදනය කරන හින්දුස්තානි සංගීත පද්ධතියට අයත් භාණ්ඩ යුගල කුමක් ද?
(1) එස්රාජය - වයලීනය (2) සිතාරය - එස්රාජය
(3) එස්රාජය - දිල්රුබාව (4) වීණාව - සිතාරය

40. සංගීත, පටිගතකිරීම් සඳහා යොදාගන්නා මෘදුකාංගයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) Cubase (2) Blue Ray Disk
(3) Sound Forge (4) Jet Audio

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**01. අංක (i) සිට ( iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංක ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.**

(i) රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගාන සමය යෙදෙන නිර්දේශිත සම්පූර්ණ ජාති රාගයේ ආරෝහණ ස්වර ලියා දක්වන්න.

(ii) භෛරවී රාගය සඳහා භාවිත කළ හැකි විවාදී ස්වරයක් නම් කරන්න.

(iii) කාෆි ථාටයට අයත් ස්වර ලියා දක්වන්න.

(iv) | ස ං | සා s ර | සා s| ග රේ s | මෙම ගී පාදය ප්‍රස්තාර වී ඇති හින්දුස්ථානි තාලය නම් කරන්න.

- **අංක (v) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟ ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.**

(v) ''පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට'' යන ගී පාදය ........................................................ විරිතට අනුව නිර්මාණය වී තිබේ.

(vi) ''තෙරේ මේරේ මිලන් කී යෙහි රෙනා'' යන ගීතය ................................................................ චිත්‍රපටයේ අඩංගු ගීතයකි.

(vii) පතල් ගී, පාරු ගී, ගැල් ගී හා පැල් ගී යන ගීත තාලයකින් තොරව ගැයෙන නිසා, ඒවා .................................... මෙහෙ ගී වශයෙන් හැඳින්වේ.

(viii) ............................................... හින්දුස්තානි සංගීත පද්ධතියේ ප්‍රධානත ම තාල වාද්‍ය භාණ්ඩය වේ.

- **අංක (ix) සිට (xii) දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ප්‍රශ්න අංකය ද සමඟ ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(ඩබ්ලිව්.බී. මකුලොලුව, රෝහණ බැද්දගේ, ඒ.ආර්. රහුමාන්, රවි ශංකර්)

| **නිර්මාණය** | **සංගීත අධ්‍යක්ෂක ගේ නම** |
|---|---|
| (ix) ''පාතර් පංචාලි'' චිත්‍රපටයේ පසුබිම් සංගීතය | |
| (x) ''දිල්සේ'' චිත්‍රපටයේ සංගීතය | |
| (xi) ''ගොයම් දා මඟුල'' සංධ්වනිය | |
| (xii) ''ජසයා හා ලෙංචිනා ''වේදිකා නාට්‍ය | |

**(ලකුණු 1×12=12)**

**02. පහත වගුවේ දැක්වෙන විස්තර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| රාගය | රාග විස්තරය |
|---|---|
| A | ශුද්ධ ස්වර අඩංගු සම්පූර්ණ ජාතියට අයත් රාගයකි. |
| B | කල්‍යාණ ථාටයෙන් බිහිවන සම්පූර්ණ ජාති රාගයකි. |
| C | ගාන සමය සර්ව කාලික යැයි ද මතයක් පවතී. |
| D | ආරෝහණයේ හා අවරෝහණයේ ස්වර පහ බැගින් යෙදේ. |

(i) ඉහත සඳහන් රාග විස්තර අනුව A, B, C, D යන රාග **හතර** පිළිවෙළින් නම් කරන්න. **(ලකුණු 04)**

(ii) **B හෝ C** යන රාග දෙකෙන් **එක්** රාගයකට අයත් මධ්‍යලය බ්‍යාල් ගීතයක හෝ ලක්ෂණ ගීතයක ස්ථායි කොටසක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. නැතහොත් මධ්‍යලය වාදිතයක ස්ථායි කොටසක් ස්වර ප්‍රස්තාර කරන්න. **(ලකුණු 04)**

(iii) ඉහත (ii) කොටසේ දී ඔබ තෝරාගත් රාගයට අයත් ආරෝහණ, අවරෝහණ, වාදි ස්වරය, සංවාදී ස්වරය ලියා දක්වන්න. **(ලකුණු 04)**

**03. පහත ජන ගී පාද ඇසුරින් පිළිතුරු සපයන්න.**

- චන්දනං යස තේජ කුංකුම
- උදේ සිටන් වකුටු කොන්ද
- නොමදින් විකුම් පාලා
- සාර සදිසි පෙති පේර නෙලන කල
- සඳවා සුදු වැලි පිවිතුරු
- දොඩම් කපාලා ඇඹුල් තනාලා
- මෝරා බීජයෙනා
- කළුගල් තලාලයි පාරට දමන්නේ

(i) ඉහත ගී පාද ගැමි ගී, සේ ගී යන කොටස් දෙකට අදාළව වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. **(ලකුණු 08)**

(ii) කරුණු **දෙකක්** යටතේ ගැමි ගී හා සේ ගී අතර සංසන්දනයක් කරන්න. **(ලකුණු 02)**

(iii) ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගැමි ගීත යන්න කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 02)**

04.

(i) තබ්ලා මුහුණතක දළ රූප සටහනක් ඇඳ පහත දැක්වෙන කොටස් එම මුහුණත මත ඊතල යොදා පෙන්වන්න. ඊතලයේ අග අදාළ කොටසේ නම ලියන්න.

(i) ස්‍යාහි (ii) චාන්ටිය (iii) ලවය **(ලකුණු 03)**

(ii) ඔබ නම් කරන ලද ස්ථාන මතට පහර දීමෙන් උපදින, අවනද්ධාක්ෂර එක බැගින් වෙන වෙන ම ලියා දක්වන්න. **(ලකුණු 03)**

(iii) දායාව හා බායාව යන කොටස් දෙකෙහි ම එකතුවෙන් උපදින අක්ෂර **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02)**

(iv) ශාස්ත්‍රීය තබ්ලා වාදනයක අඩංගු අංග **දෙකක්** හා ලෝව ප්‍රකට තබ්ලා වාදකයින් දෙදෙනෙකුගේ නම් ලියා දක්වන්න. **(ලකුණු 04)**

**05. සංගීතය, නාදය මාධ්‍ය කොට ගත් කලාවකි.**

(i) නාද යන්න **කෙටියෙන්** හඳුන්වන්න. **(ලකුණු 02)**

(ii) නාද හා ශබ්ද අතර පවතින වෙනස්කම් **දෙකක්** ලියා දක්වන්න. **(ලකුණු 02)**

(iii) සංඛ්‍යාතය යන්න **කෙටියෙන්** විස්තර කරන්න. **(ලකුණු 02)**

(iv) නාදයේ ත්‍රිවිධ ගුණ භාරතීය සංගීතයට අනුව නම් කරන්න. **(ලකුණු 3×2 = 6)**

06. **පහත ගී පාද ඇසුරින් පිළිතුරු සපයන්න.**

A. ''එන්ඩ ද මැණිකේ මමත් දියඹටා''
B. ''තැර ඉස්ති තැර''
C. ''ශ්‍රී රාහුල හිමිගේ නාමේ''

(i) A,B,C යන ගී පාද අයත්, ව්‍යවහාරික සංගීතාංග පිළිවෙළින් නම් කරන්න. **(ලකුණු 03)**

(ii) A හි දැක්වෙන ව්‍යවහාරික සංගීතාංගය සඳහා නිර්මාණ දායකත්වය ලබා දී ඇති මුල් යුගයේ සංගීතඥයින් **තිදෙනෙක්** නම් කරන්න. **(ලකුණු 03)**

(iii) C හි දැක්වෙන ව්‍යවහාරික සංගීතාංගයේ ගීත ගායනා කර ඇති ගායකයින් **දෙදෙනෙක්** හා එම ගීත සඳහා සංගීත නිර්මාණය කළ සංගීතඥයන් **දෙදෙනෙකු** නම් කරන්න. **(ලකුණු 04)**

(iv) B හි දැක්වෙන ගීත සම්ප්‍රදාය ඇසුරු කර ගනිමින් නිර්මාණය වූ ගීත **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02)**

07.
(i) පහත දැක්වෙන බටහිර සංගීත ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග සංගීත ක්‍රමයට පෙරළා තාලානුකූලව ප්‍රස්තාර කරන්න. **(ලකුණු 04)**



(ii) ඔබ විසින් පෙරදිග ක්‍රමයට ලියූ ප්‍රස්තාර කොටස මධ්‍යම භාවයට (F major ස්කේලයට) පරිවර්තනය කර, පෙරදිග ක්‍රමයට ලියා දක්වන්න. **(ලකුණු 02)**

(iii) පහත දැක්වෙන බටහිර සංගීත පාරිභාෂික පද කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) Leger line
(ආ) Rests
(ඉ) Dotted Notes **(ලකුණු 2×3=06)**

## 10 ශ්‍රේණිය තුන්වන වාර පරීක්ෂණය - 2023 පෙරදිග සංගීතය

## පිළිතුරු පත්‍රය

### 1 කොටස

| | | | |
|---|---|---|---|
| 1. **4** | 11. **2** | 21. **3** | 31. **1** |
| 2. **1** | 12. **3** | 22. **1** | 32. **4** |
| 3. **2** | 13. **1** | 23. **3** | 33. **2** |
| 4. **3** | 14. **3** | 24. **2** | 34. **1** |
| 5. **4** | 15. **3** | 25. **2** | 35. **2** |
| 6. **2** | 16. **2** | 26. **1** | 36. **3** |
| 7. **3** | 17. **4** | 27. **4** | 37. **2** |
| 8. **3** | 18. **2** | 28. **2** | 38. **3** |
| 9. **3** | 19. **3** | 29. **3** | 39. **3** |
| 10. **2** | 20. **2** | 30. **2** | 40. **1** |

### 2 කොටස

1)

- I. ස රි ග ම´ ප ධ නි ස̇
- II. ශුද්ධ රිෂභය/ ශුද්ධ ගාන්ධාරය/ තීව්‍ර මධ්‍යමය/ ශුද්ධ ධෛවතය/ ශුද්ධ නිශාදය යන පිළිතුරු අතරින් එකක්.
- III. ස රි ග̲ ම ප ධ නි̲ ස̇
- IV. ජප් තාලය
- V. සමුද්‍රඝෝෂ
- VI. අභිමාන්
- VII. අනාඝාතාත්මක
- VIII. තබ්ලාව
- IX. රවි ශංකර්
- X. ඒ.ආර් . රහුමාන්
- XI. ඩබ්ලියු. බී මකුලොලුව
- XII. රෝහණ බැද්දගේ

02.

I. A - බිලාවල්

B - යමන්

C - භෛරවී

D - භූපාලි

II. සුදුසු ගීතයක් හෝ වාදිතයක් නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

III. රාගයට අදාළව තොරතුරු නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03.

I. ගැමි ගී - උදේ සිටන් වකුටු කොන්ද/සාර සදිසි පෙති/ දොඩම් කපාලා/ කළුගල් තලාලයි

සේ ගී - චන්දනං යස/ නොමදින් විකුම්/සදවා සුදු වැලි/ මෝරා බීජයෙනා

II. නිවැරදි කරුණු දෙකක් සඳහා ලකුණු දෙන්න.

III. තාල සහිතව ගැයෙන ගී ආඝාතාත්මක ගී ලෙස ද තාල රහිතව ගැයෙන ගී අනාඝාතාත්මක ගී ලෙස හඳුන්වයි.

04.

I. කොටස් තුන නිවැරදිව දක්වා ඇති රූපයක් සඳහා ලකුණු දෙන්න.

II. නිවැරදි අක්ෂර සඳහා ලකුණු දෙන්න.

III. ධා/ධිං/ ධි යන අක්ෂර අතරින් දෙකක්.

IV. නිවැරදි අංග නම් කිරීම සහ වාදකයින් නම් කිරීමට ලකුණු දෙන්න.

06.

I. A- ගුවන්විදුලි සරල ගී B- කපිරිඤ්ඤා ගී C- ග්‍රැමෆෝන් ගී

II. සංගීතඥයින් තුන් දෙනෙක් සඳහා ලකුණු දෙන්න.

III. නිවැරදි නම් කිරීම් සඳහා ලකුණු දෙන්න.

IV. ගීත දෙකක් නම් කිරීමට ලතුණු දෙන්න.

07.

I. /ග ප ප ප / ප - ධ නි / ධ - ප ප / ම - ග - / රි ග ම ප /ම - ග - / රි - - - / - - - - /

II. /ධ සි සි සී / සී - රි ගී / රී - සී සී / නි - ධ - / ප ධ නි සී / නි - ධ - / ප - - - / - - - - /

III. නිවැරදි කෙටි සටහන් සඳහා ලකුණු දෙන්න.

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**